**ශීර්ෂය 135 - වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය**

**-----------------------------------------------------------**

1. **මූල්‍ය ප්‍රකාශන**

----------------

1.1 **තත්ත්වාගණනය කළ මතය**

--------------------------------

වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනය 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2020 ජූලි **20** දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 20**21** ජනවාරි 22 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව පිළියෙල කළ එම මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

-----------------------------------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 **මූල්‍ය ප්‍රකාශනය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

--------------------------------------------------------------------------------

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කළ සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

-----------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින්,වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින් තවදුරටත් ,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීමෙන් වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වංචාවක් ඇතිවීමට හේතුවන බැවිනි.
- අමාත්‍යාංශයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම් අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

-----------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) වගන්තිය හා 38 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මම ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බව,

(ආ) මෙම වාර්තාවේ 1.6.2, 1.6.4 (ආ) සහ 1.6.6 ඡේදවල නිරීක්ෂණ සම්බන්ධයෙන් පසුගිය වර්ෂයේ ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ වාර්තාවෙන් පෙන්වා දෙන ලද නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය කර්යසාධන ප්‍රකාශය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අමාත්‍යාංශය යටතේ ඇති අංක 20.02.01.04 දරන කල් බදු කුලී ආදායම් ශීර්ෂය මගින් රැස්කළ ආදායම, භාණ්ඩාගාර ආදායම් සාරාංශ වාර්තාව **(SA-20)** අනුව රු.754,243,669 ක් වී තිබුණි. එහෙත් සමාලෝචිත වර්ෂයට අදාල මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ බදු නොවන ආදායම් ලෙස එය රු.753,578,967 ක් වශයෙන් දක්වා තිබුණි. ඒ අනුව රු.664,702 ක වෙනසක් නිරීක්ෂණය විය. | චක්‍රලේඛය ප්‍රකාරව භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත සටහන් 70 ට අනුව රැස්කළ සම්පූර්ණ ආදායම, ආදායම් ගිණුමට ගත යුතුය. | භාණ්ඩාගාර මුද්‍රිත සටහන් 70 අනුව අංක 20.02.01.04 දරන ආදායම් සංකේතයේ ප්‍රාදේශීය වැවිලි සමාගම් වෙතින් රැස් කළ ආදායම රු.754,243,669/-ක් වුව ද, කල්බදු කුලී ලෙස රු.753,578,967/-ක් අය කරගෙන ඇත. ඉතිරි රු.664,702/-ක මුදල උප බදු දීම්වලට අදාළව රජයට ගෙවිය යුතු සියයට 20 මුදල වේ. ඒ අනුව ඉදිරියේදී ඉහත ආදායම් ශීර්ෂයේ මුළු ආදායම ගිණුම්වලට ඇතුළත් කිරීමට සටහන් කරගතිමි. |

### 1.6.2 මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2019 දෙසැම්බර් 31 දිනට තැන්පත් ගිණුම් පිළිබඳ ප්‍රකාශනය (ඒසීඒ 4) අනුව තැන්පත් ගිණුම් දෙකක අමාත්‍යාංශ පොත් අනුව ශේෂය රු.250,468 ක් වුවද භාණ්ඩාගාර ගිණුම් අනුව එම ශේෂය රු.229,968 ක් වීම නිසා රු.20,500 ක හඳුනානොගත් වෙනසක් නිරීක්ෂණය විය. | මු.රෙ 427 අනුව අමාත්‍යාංශ පොත්, භාණ්ඩාගාර පොත් සමඟ සසඳා වෙනස්කම් හඳුනාගෙන නිවැරදි කළ යුතුය. | මෙය 2016 වර්ෂයේ පැවති පොදු තැන්පතු ගිණුම නව ගිණුම් 4කට වෙන් කළ අවස්ථාවේ අමාත්‍යාංශ ගිණුම් පොත්වල හා CIGAS වැඩසටහනෙහි ආරම්භක ශේෂ සටහන් කිරීමේදී ඇති වූ දෝෂයකි. පොදු තැන්පතු ගිණුමේ පැවතිය යුතු ශේෂයක් රජයේ ආදායමට බැර කර තිබීම මෙම වෙනසට හේතු වී ඇත. එම ශේෂය නැවත රජයේ ආදායමෙන් ලබාගැනීම සඳහා අවශ්‍ය නිර්දේශ ලබා ගැනීමට අදාළ ආදායම් ගණන් දීමේ නිලධාරි වෙත යොමු කර ඇත. |

## 1.6.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය රු. 2,083,340,050 ක් වුවද, එයට ගාස්තු අධිභාර හා දඩමුදල් සහ බලපත්‍ර ගාස්තු ද ඇතුළත් කර මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය රු.2,836,919,017 ක් ලෙස එනම් රු.753,578,967 ක් වැඩියෙන් දක්වා තිබුණි. | රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව ගාස්තු , අධිභාර හා දඩමුදල් සහ බලපත්‍ර ගාස්තු මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයට ඇතුළත් නොවිය යුතුය. | අමාත්‍යාංශයේ වතු සමාගම් මගින් එකතු කරන ලද බදුකුලී ආදායම ඒ යටතේ දක්වා ඇති අතර, සෘජුව භාණ්ඩාගාරයට තැන්පත් කරන ලද මුදල් ඉදිරියේදී මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ඇතුළත් නොකිරීමට සටහන් කර ගතිමි. |
| (ආ) | මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය රු.2,038,159,212 ක් වුවද එය මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ රු.3,676,192,927 ක් ලෙස දක්වා තිබුණි. ඒ අනුව මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය වූ මුදල් ප්‍රවාහය රු.1,638,033,715 ක් වැඩියෙන් සටහන් කර තිබුණි. මේ සඳහා අමාත්‍යාංශය යටතේ වන ව්‍යවස්ථාපිත මණ්ඩල හා ආයතන විසින් දරන ලද මෙහෙයුම් වියදම්ද ඇතුළත් කර තිබීම හේතුව බව නිරීක්ෂණය විය. | අමාත්‍යාංශය යටතේවන ව්‍යවස්ථාපිත මණ්ඩල හා ආයතන විසින් දරන ලද මෙහෙයුම් වියදම්, අමාත්‍යාංශයේ මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහයක් ලෙස හඳුනානොගත යුතු වීම. | රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවෙන් පැහැදිලි කිරීම් ලබාගෙන ඉදිරියේදී මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ වටිනාකම් ඇතුළත් කිරීමට කටයුතු කරමි. |
| (ඇ) | රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් අයකර ගැනීම්වල එකතුව මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය යටතේ දැක්විය යුතු වුවද එසේ දක්වා නොතිබුණි. එම ප්‍රමාණය භාණ්ඩාගාර අවසාන පරිගණක සටහන අනුව රු.11,399,259 ක් බව නිරීක්ෂණය විය. | රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් අයකර ගැනීම් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය යටතේ දැක්විය යුතුය. | මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය යටතේ රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුමේ මුළු අයකිරීම්වල එකතුව දැක්වීමට සටහන් කරගතිමි. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය රු.23,965,127 ක් වුවද, අමාත්‍යාංශය යටතේ වන ආයතන මගින් ප්‍රාග්ධන වැය විෂයයන් සඳහා දැරූ වියදම්ද සමඟ රු.3,394,811,098 ක් ලෙස දක්වා තිබුණි. ඒ අනුව ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය වූ මුදල් ප්‍රවාහය රු.3,370,845,971 ක් වැඩියෙන් සටහන් කර තිබුණි. | ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහයට, අමාත්‍යාංශය යටතේ වන ආයතන මගින් දැරූ ප්‍රාග්ධන වියදම් ඇතුළත් නොවිය යුතුය. | අමාත්‍යාංශය යටතේ වන ආයතන මගින් ප්‍රාග්ධන වැය විෂයය යටතේ වූ වියදම් ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැයකරන ලද මුදල් ප්‍රවාහයේ සටහන් කර ඇති බැවින් ඒ අනුව එහි වියදම වැඩියෙන් දක්වා තිබූ අතර එම වියදම මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මාරු කිරීම් යටතේ ඇතුළත් කිරීමට සටහන් කරගතිමි. |
| (ඉ) | මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය යටතේ තැන්පතු ලැබීම් රු. 12,887,672 ක් වුවත් එය මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ දක්වා නොතිබීම නිසා මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | තැන්පතු ලැබීම්, මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය යටතේ දැක්විය යුතුය. | මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයේ පොදු තැන්පත් ලැබීම් සටහන් කර ඉදිරියේදි නිවැරදි කර ගැනීමට සටහන් කරගතිමි. |

**1.6.4 අත්තිකාරම් ගිණුම් ශේෂ**

**--------------------------**

| විගණන නිරීක්ෂණය<br>---------------------- | නිර්දේශය<br>----------- | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම<br>-------------------------------------- |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ අවසානයට භාණ්ඩාගාර පොත් හා අමාත්‍යාංශ පොත් අතර පැවති රු.56,769 ක වෙනස හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | මු.රෙ. 427 අනුව අමාත්‍යාංශ පොත්, භාණ්ඩාගාර පොත් සමඟ සසඳා වෙනස්කම් හඳුනාගෙන නිවැරදි කළ යුතුය. | රු.56,769 ක් වන මෙම ණය ශේෂය ජනාධිපති ලේකම් කාර්යාලයේ සිට අප අමාත්‍යාංශය වෙත ස්ථාන මාරු වී පැමිණි විමල් අබේවර්ණ මහතාට අයත් වේ. එම නිලධාරියා 1996 ජුලි මස යුධ හමුදා දෙපාර්තමේන්තුව වෙත ස්ථාන මාරු වී ගොස් ඇති අතර, එම දෙපාර්තමේන්තුවෙන් 1997 සැප්තැම්බර් 01 දින රු.73,465 ක් වටිනා චෙක්පතක් අප අමාත්‍යාංශය වෙත එවා ඇති බව පැරණි ලිපිගොනු පරීක්ෂා කිරීමේදි අනාවරණය විය. ඒ අනුව අවශ්‍ය ඉදිරි කටයුතු සිදු කරමින් පවතී. |

**1.6.5 අග්‍රිම ශේෂය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| අග්‍රිම ගිණුම (ඒසීඒ 3)අනුව අග්‍රිම ලැබීම් හා පියවීම් යන දෙකෙහි භාණ්ඩාගාර මුද්‍රිත සටහනේ ඇති වටිනාකමට වඩා රු.35,354,381 ක් බැගින් වැඩියෙන් දක්වා තිබුණි. | අග්‍රිම ගිණුමේ අග්‍රිම ලැබීම් හා පියවීම්, භාණ්ඩාගාර මුද්‍රිත සටහනේ ඇති වටිනාකම් සමඟ සැසදිය යුතුය. | වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සඳහා වූ වටිනාකම් හරස් සටහන් ලැබීම් හා ගෙවීම් සමඟ ඉදිරිපත් කර ඇති බැවින් අග්‍රිම ගිණුමේ ලැබීම් හා ගෙවීම් වැඩියෙන් සටහන් වී ඇති අතර ඉදිරියේදී මුදලින් ලැබීම් හා ගෙවීම් අනුව අග්‍රිම ගිණුමට අදාළ වටිනාකම් ඉදිරිපත් කිරීමට සටහන් කර ගතිමි. |

**1.6.6 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| මු.රෙ. 891(i) පරිදි ඇප තැන්පතු ලේඛනයක් පවත්වා නොතිබුණි. | මුදල් රෙගුලාසිවල සඳහන් තොරතුරු ඇතුළත් වන පරිදි ඇප තැබිය යුතු නිලධාරීන් පිළිබඳ ඇප ලේඛනයක් පවත්වා ගත යුතුය. | ඇප තැන්පත් කිරීම සම්බන්ධ කටයුතු සිදු කරමින් පවතින අතර, අනතුරුව ඇප තැබීමේ ලේඛනය යාවත්කාලීනව නඩත්තු කිරීමට කටයුතු කරමි. |

**1.6.7 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

**-----------------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| නිරීක්ෂණය | | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| නීති,රීති හා රෙගුලාසි වලට අනුකූල නොවීම යොමුව | | | |
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මු. රෙ. 1646 | වාහන භාර නිලධාරීන් විසින් මාසයකට පසු ඊළඟ මාසයේ 15 දිනට ප්‍රථම මාසික සාරාංශයේ මුල් පිටපතක්ද සමඟ, දෛනික ධාවන සටහන් විගණකාධිපති වෙත යැවිය යුතු වුවත් එසේ කටයුතු කර නොතිබුණි. | නියමිත දිනට මාසික සාරාංශයේ පිටපතක්ද සමඟ දෛනික ධාවන සටහන් විගණකාධිපති වෙත යැවීමට කටයුතු කළ යුතුය. | දෛනික ධාවන සටහන් සාරාංශගත කර නොතිබීම හේතුවෙන් මෙම ප්‍රමාදය සිදුවී ඇත. ඉදිරියේදී ප්‍රමාදයකින් තොරව නියමිත පරිදි ධාවන සටහන් ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ. |
| **(ආ)** රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ | | | |
| (i) 1985 **මැයි** 10 **දිනැති අංක** 289 **හා** 1992 අගෝස්තු 19 දිනැති අංක 26/92 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ. | රජයේ වාහනවල රාජ්‍ය ලාංඡනය යෙදිය යුතු වුවත්, රාජ්‍ය ලාංඡනය නොමැතිව වාහන ධාවනයේ යොදවා පැවති අවස්ථා තිබුණි. | රජයේ වාහනවල රාජ්‍ය ලාංඡනය යෙදිය යුතුය. | සෑම වාහනයක් තුළ ම රාජ්‍ය ලාංඡනය පිටතට පෙනෙන ලෙස තබා ඇති අතර ඉදිරියේ දි රාජ්‍ය ලාංඡනය සහිත ස්ටිකරයක් ඇලවීමට කටයුතු සැලසුම් කර ඇත. |
| (ii) 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන චක්‍රලේඛයේ 3.01 ඡේදය | සෑම ඉන්ධන පරීක්ෂාවකටම පසු මාස 12 ක කාලසීමාවකින්ම පසුව හෝ කිලෝමීටර් 25,000 ක දුර ප්‍රමාණයක් ධාවනය | චක්‍රලේඛයෙන් දක්වා ඇති පරිදි ඉන්ධන පරීක්ෂාවන් කළ යුතුය. | මේ සම්බන්ධව කටයුතු සිදු කරමින් පැවති අතර වාහන 04ක ඉන්ධන පරීක්ෂාවක් සිදු කරන ලදී. හදිසියේම ඇති වූ |

| | | | | |
|---|---|---|---|---|
| | | කිරීමෙන් පසුව හෝ එන්ජිමට සම්බන්ධ ප්‍රධාන අලුත්වැඩියාවකට පසුව හෝ යන කාරණා අතරින් මුලින්ම යෙදෙන අවස්ථාවට පසුව නැවත ඉන්ධන පරීක්ෂාවක් කළ යුතු වුවත්, ඊට අනුකූලව කටයුතු නොකළ අවස්ථා තිබුණි. | | කොරෝනා වසංගත තත්වය හේතුවෙන් එම කටයුතු අඩපණ විය. ඉදිරියේදී ඉතිරි අනෙකුත් වාහනවල ඉන්ධන පරීක්ෂාව සිදු කිරීමට කටයුතු යොදා ඇත. |
| (ඇ) | 2015 ජුලි 10 දිනැති **අංක** 02/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 09 (ඊ) ඡේදය | අපහරණය සඳහා හඳුනාගනු ලබන වාහන තක්සේරු කිරීමෙන් පසුව එකී වාහනවල ආරක්ෂාව පිළිබඳව විශේෂ වැඩපිළිවෙලක් යෙදිය යුතු වුවද, අපහරණය කළ යුතු බවට හඳුනාගත් වාහන පහක් එළිමහනේ අනාරක්ෂිතව ගාල් කර තිබුණි. | අපහරණය සඳහා හඳුනාගනු ලබන වාහන තක්සේරු කිරීමෙන් පසුව එකී වාහනවල ආරක්ෂාව පිළිබඳව විශේෂ වැඩපිළිවෙලක් යෙදිය යුතුය. | සෙත්සිරිපාය දෙවන අදියර පරිශ්‍රය තුළ අමාත්‍යාංශයේ ගරු අමාත්‍යතුමන්ලාගේ, ලේකම්වරුන්ගේ, රථ සඳහා පමණක් වැසි ආවරණ තුළ ගාල් කිරීමේ පහසුකම් සපයා ඇත. අනෙක් රථ පරිශ්‍රය තුළ එළිමහනේ වැසි ආවරණ රහිතව ගාල් කර ඇත. එසේම, අමාත්‍යාංශය සතු වෙනත් ආරක්ෂාකාරී හිස් ඉඩමක් නොමැති බැවින් ආරක්ෂක නිලධාරීන් යොදවා ඇති වැව්ලි කළමනාකරණ ආයතනයේ මෙම රථ තාවකාලිකව ගාල් කර ඇත. |
| (ඈ) | භාණ්ඩාගාර ලේකම්ගේ 2018 මාර්තු 19 දිනැති **අංක** 01/2018 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 02(අ) ඡේදය | 2015 ජුලි 10 දිනැති අංක 02/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය මගින් ලබාදී ඇති උපදෙස් අනුගමනය කරමින් ධාවනය කළ නොහැකි තත්ත්වයේ පවතින සියලුම වාහන 2018 ජුනි 30 දිනට පෙර අපහරණය කළ යුතු වුවත්, වැව්ලි කර්මාන්ත අමාත්‍යාංශයට අයත් | 2015 ජුලි 10 දිනැති අංක 02/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය මගින් ලබාදී ඇති උපදෙස් අනුගමනය කරමින් ධාවනය කළ නොහැකි තත්ත්වයේ | දැනට මෙම රථ කඩිනමින් අපරහණය කිරීමට කටයුතු සිදු කරමින් පවතී. |

| | |
|---|---|
| භාවිතා කළ නොහැකි යැයි හඳුනාගෙන තිබූ වාහන විගණිත දින වූ 2020 පෙබරවාරි 13 වන විටත් අපහරණය කර නොතිබුණි. | පවතින වාහන අපහරණය කළ යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

----------------------

**2.1 ආදායම් කළමනාකරණය**

----------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) 1992 වර්ෂයේදී රජයට අයත් එකතුව හෙක්ටයාර් 249,843 ක් වූ ඉඩම් ප්‍රාදේශීය වැවිලි සමාගම් 23 ක් වෙත අවුරුදු 53 ක කාලයක් සඳහා බදු කුලී පදනම මත පවරා දී තිබුණි. හිඟ ආදායම් පිළිබඳ ප්‍රකාශනය අනුව 2019 දෙසැම්බර් 31 දිනට එම සමාගම් අතුරින් සමාගම් 12 කින් රජයට අයවිය යුතු රු.780,608,549 ක බදු ආදායම හිඟහිටව තිබූ අතර, මු. රෙ. 176 (2) හා (3) ප්‍රකාරව අප්‍රමාදව හිඟ හිටි ආදායම් එකතු කර ගැනීම පිළිබඳව කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 175(2) හා (3) ප්‍රකාරව ආදායම් එකතු කරන නිලධාරියා කටයුතු කළ යුතුය. මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කිරීම පැහැර හැර ඇති නිලධාරින් සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ **XLVII** පරිච්ඡේදයේ 8.1 හා 8.2 වගන්ති ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | 2020 ජනවාරි 01 දිනට රු. 780,608,549 ක මුදලක් වැවිලි සමාගම් 12කින් ලැබිය යුතු ව තිබූ අතර, එයින් වැඩි ම මුදලක් ලැබිය යුතු ව ඇත්තේ කුරුණෑගල වැවිලි සමාගමෙන් වේ. කුරුණෑගල වැවිලි සමාගම විසින් පාලනය කරනු ලබන ඉඩම්වලින් පොදු කටයුතු සඳහා ඉඩම් අත්පත් කර ගැනීම හේතුවෙන් එම සමාගමේ ශුද්ධ වත්කම්වල වටිනාකම අඩු වී ඇති බැවින් වාර්ෂික බදු කුලී මුදල සංශෝධනය කරන ලෙස එම සමාගම විසින් ඉල්ලා ඇත. එහෙත් ඒ සඳහා මහා භාණ්ඩාගාරය විසින් එකඟතා ලබා දී නොමැති අතර, සමාගම සතුව දැනට පවතින ශුද්ධ වත්කම් වටිනාකම පදනම් කොටගෙන එම සමාගම විසින් සංශෝධිත බදු කුලියක් ගෙවනු ලැබේ. රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක PE/PL/KPL/GEN/2017 හා 2018 අගොස්තු 02 දිනැති ලිපිය මගින් මෙතෙක් ගෙවා නොමැති බදු මුදල් පැහැර හැරීමකින් තොරව ගෙවන ලෙස අපට ද පිටපතක් සහිතව කුරුණෑගල වැවිලි සමාගම වෙත ලිඛිත ව දන්වා ඇත. එසේ ම මේ පිළිබඳ මහා භාණ්ඩාගාරයේ ප්‍රධානත්වයෙන් කුරුණෑගල වැවිලි සමාගම සමග සාකච්ඡාවක් පැවැත්වීමට අප විසින් මුදල් අමාත්‍යාංශය වෙතින් ඉල්ලීමක් ඉදිරිපත් කර ඇති අතර, ඉදිරියේදී මේ පිළිබඳව තීරණයක් ගැනීමට යෝජිත ය. |

| | | | |
|---|---|---|---|
| | | | එසේ ම 2019 දෙසැම්බර් 31 දිනට බදු කුලී ලැබිය යුතු වැවිලි සමාගම් 11කින් වැවිලි සමාගම් 8ක් රු.122,812,218 ක මුදලක් ගෙවා ඇති අතර, කොටගල, කුරුණෑගල, මස්කෙළිය හා හලාවත වැවිලි සමාගම් විසින් මේ දක්වා කිසිදු මුදලක් ගෙවා නොමැත.<br><br>එසේ ම හිඟ බදු කුලී ගෙවන ලෙස අදාළ වැවිලි සමාගම් වෙත ලිඛිත ව දැනුම් දී ඇති බවත්, එම මුදල් ගෙවීම් කරන තුරු අදාළ වැවිලි සමාගම්වල කළමනාකරණ සැලැස්ම කටයුතු සඳහා අනුමැතිය ලබා නොදීමටත් කටයුතු කර ඇත.<br><br>එසේ ම මෙම වැවිලි සමාගම් හා අදාළ පාර්ශවයන් සමග සාකච්ඡාවක් පවත්වා අදාළ ගැටලු විසඳීමට අප විසින් රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව වෙතින් ඉල්ලීමක් ඉදිරිපත් කර ඇති අතර, ඉදිරියේදී මේ පිළිබඳව තීරණයක් ගැනීමට යෝජිත ය. |
| (ආ) | 1995 වර්ෂයේ නොවැම්බර් 27 දිනැතිව කුරුණෑගල වැවිලි සමාගම සමඟ ඇතිකරගත් අංක 1558 දරන කල් බදුකුලී සංශෝධිත ගිවිසුම අනුව එදිනට පැවති ශුද්ධ වත්කම් ප්‍රමාණයමත ගණනය කළ බදු මුදල වසර 53 ක් තුළ, වසරකදී සමාන වාරික හතරකින් ගෙවිය යුතු විය. එහෙත් ශුද්ධ වත්කම් මත වසරකට ගෙවිය යුතු බදු මුදලට වඩා අඩුවෙන් ගෙවීම නිසා 2019 දෙසැම්බර් 31 දිනට රු. 214,213,729 ක හිඟයක් තබමින් එම කොන්දේසිය කඩ කර තිබුණි. | ගිවිසුම් දිනට පැවති ශුද්ධ වත්කම් ප්‍රමාණය මත ගණනය කළ බදු මුදල වසර 53 ක් තුළ, වසරකදී සමාන වාරික හතරකින් ගෙවිය යුතුය. | කුරුණෑගල වැවිලි සමාගම රජයේ යටතේ පවතින බැවින් හා එම සමාගම විසින් බදුකුලී ගෙවීම සම්පූර්ණයෙන් පැහැර හැරීමක් සිදු නොකර ඇති බවත්, ඔවුන්ගේ ගණනය කිරීම් අනුව අඩු බදු කුලියක් ගෙවනු ලැබේ. එබැවින්, ඉදිරියේදී ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳව අප විසින් මුදල් අමාත්‍යාංශ ලේකම්ගෙන් උපදෙස් ඉල්ලා ඇත. |
| (ඇ) | කොටගල හා හලාවත වැවිලි සමාගම්වලින් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු. මිලියන 291 ක බදු කුලි ආදායමක් ගෙවා නොතිබූ අතර, ඒ සඳහා ගිවිසුමේ 5 (c) | හිඟ ආදායම් බදු අයකරගැනීමට කටයුතු කළයුතු අතර නොගෙවන්නේනම් ගිවිසුම් ප්‍රකාරව ක්‍රියාමාර්ග ගත යුතුය. | හලාවත වැවිලි සමාගම විසින් 2019/12/31 දිනට හිඟ බදු මුදල් වන රු.77,718,730 න් 2020 වර්ෂයේ නොවැම්බර් මස වනවිට රු. 28,220,561ක් ගෙවා ඇත. එසේම ඉතිරි හිඟ බදු කුලිය ගෙවන ලෙස හලාවත වැවිලි සමාගම වෙත ලිඛිතව දැනුම් දී ඇත. |

| | | | |
|---|---|---|---|
| | ඡේදය ප්‍රකාරව බදු ගිවිසුම අවලංගු කිරීම සඳහා වූ ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | | කොටගල වැවිලි සමාගම විසින් මේ දක්වා කිසිදු බදු මුදලක් ගෙවා නොමැති අතර, පස් අවුරුදු වන කළමනාකරණ සැලැසුමට අනුව කරනු ලබන දැව හෙලීම්වලින් ලැබෙන ආදායමින් බදු මුදල ගෙවන ලෙසත්, එම බදු මුදල ගෙවන තෙක් ඉදිරියේදී දැව හෙලීම් සඳහා අවසර ලබා නොදෙන බවත් දන්වා ඇත. එසේම කොටගල වැවිලි සමාගමට අයත් මිල්ලෑව වත්තෙන් හෙක්ටයාර 329ක් නාගරික සංවර්ධන අධිකාරිය විසින් අත්පත් කර ගෙන ඇති අතර, එයට අදාළ වන්දි මුදල් ලැබීමෙන් අනතුරුව හිඟ බදු මුදල් ගෙවන බව සමාගම විසින් දන්වා ඇත.<br><br>තවද, සංශෝධිත බදු ගිවිසුමේ 5C වගන්තියෙහි පවතින ප්‍රතිපාදන ප්‍රකාරව බදු මුදල් නොගෙවීමේ කොන්දේසි කඩකිරීම සම්බන්ධයෙන් බදු ගිවිසුම් අවලංගු කිරීමේ හැකියාවක් පවතින බැවින්, බදු ගිවිසුම්හි සඳහන් නීතිමය ප්‍රතිපාදන ක්‍රියාත්මක කරන ලෙස බදු දීමනාකරු වන ජනතා වතු සංවර්ධන මණ්ඩලය හා ශ්‍රී.ල.රා.වැ.ස වෙත දන්වා ඇත. |
| (ඇ) | 1992 වර්ෂයේදී රජයට අයත් ඉඩම් ප්‍රාදේශීය වැවිලි සමාගම් වෙත බදු දීමේදී, එම ඉඩම්වලින් අයවියයුතු බදු කුලිය ගණනය කිරීම සඳහා යොදාගත් සූත්‍රයට අනුව ශුද්ධ වත්කම් වටිනාකම රු.මිලියන 200 ඉක්මවා තිබිය යුතුවිය. ඒ අනුව එදිනට එම වටිනාකමට වඩා අඩු වූ ආගරපතන, උඩුපුස්සැල්ලෑව හා ඇල්කඩුව යන වැවිලි සමාගම් තුන වෙත ඉඩම් හෙක්ටයාර් 20,757 ක් බදු කුලී රහිතව ලබා දී වසර 26 ක කාලයක් ගත වී තිබුණි. වර්තමානය වනවිට ඉන් සමාගම් දෙකක ශුද්ධ වත්කම් රු.මිලියන 200 ඉක්මවා තිබුණද, බදු කුලියක් අය නොවන බැවින් එවැනි අවස්ථාවලදී ක්‍රියාකළයුතු | වර්තමානයේදී මූල්‍යමය වශයෙන් ස්ථාවර බවක් පෙන්නුම් කර තිබියදීත් රජයේ ඉඩම් භාවිතා කිරීම වෙනුවෙන් රජයට ප්‍රතිලාභයක් ලබා ගැනීම සඳහා බදු ගිවිසුම් සංශෝධනය කිරීම පිළිබඳව ඊට අදාළ ආයතනවල අවධානය යොමු කළයුතුය. | එකඟ වේ.<br><br>1992 වර්ෂයේදී ස්ථාපිත කර ඇති ප්‍රාදේශීය වැවිලි සමාගම් 23ට අදාළව, එම වර්ෂයේ සිට 1995 ජුනි දක්වා බදුකුලී අයකිරීම සිදුකළ යුත්තේ එම වැවිලි සමාගම් වෙත බදු දෙන ලද ඉඩම්වල හිමිකරුවන් වන ජනතා වතු සංවර්ධන මණ්ඩලය හා ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව විසිනි. (අදාළ බදු ගිවිසුම් අනුව) 1995 වර්ෂයේදී රජය ප්‍රාදේශීය වැවිලි සමාගම් සමග අත්සන් කර ඇති සංශෝධිත බදු ගිවිසුම් අනුව එම වැවිලි සමාගම්වල 1994.12.31 දිනට තිබූ ශුද්ධ වත්කම්වල වටිනාකම රු මිලියන 200 ඉක්මවූ සමාගම්වල පමණක් බදුකුලී සංශෝධනය වී ඇත. ඒ අනුව බදු කුලී සංශෝධනය වූ වැවිලි සමාගම් වලින් බදුකුලී අයකිරීම එම බදු ගිවිසුම් අනුව මහා භාණ්ඩාගාරය වෙනුවෙන් වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය විසින් සිදු කරනු ලැබේ. කෙසේ වෙතත් උඩුපුස්සැල්ලාව, ආගරපතන හා ඇල්කඩුව |

| | | | |
|---|---|---|---|
| | ආකාරය සම්බන්ධව ප්‍රතිපාදන බදු ගිවිසුම්වල නොමැති නිසා එම රජයේ ඉඩම්වලින් බදු කුලියක් අයකර ගැනීමට නොහැකිවී තිබුණි. | | වැවිලි සමාගම්වල ශුද්ධ වත්කම්වල වටිනාකම 2011 වන විට රු. මිලියන 200ට වඩා වැඩි වී තිබුණද බදු කුලී පිළිබඳව සංශෝධනයක් කළ හැකි වන්නේ බදු ගිවිසුමේ සඳහන් කොන්දේසි සංශෝධනය කිරීමකින් පසුව වන අතර බදු ගිවිසුම් වල එවැනි සංශෝධනයක් කළ හැකි වන්නේ අදාළ සමාගමේද එකඟතාවය ඇතිවය. සමස්ත වශයෙන් සියලුම වැවිලි සමාගම් සමඟ අත්සන් කර ඇති බදු ගිවිසුම්වල සඳහන් කොන්දේසිවල සිදුවිය යුතු සංශෝධනයන් පිළිබඳව මෙම අමාත්‍යාංශය විසින් මහා භාණ්ඩාගාරය දැනුවත් කර ඇත. |
| (ඉ) | 1992 වර්ෂයේදී හිමිවූ රජයේ බදු ඉඩම් උකස් කර එම වැවිලි සමාගම්වලට ණය ලබා ගැනීමේ හැකියාව ගිවිසුමේ 3 (බී) ඡේදයෙන් දී තිබූ අතර වැවිලි සමාගම්වලින් ඉදිරිපත් කර තිබූ මූල්‍ය ප්‍රකාශ අනුව වතු සමාගම් 18 ක් වාණිජ බැංකුවලින් එකතුව රු.8,207,028,962 ක දීර්ඝකාලීන ණය ලබා ගෙන තිබුණි. එම ණය මුදල් පියවා දැමීමට නොහැකි වීම මත එම ඉඩම්වල බදු අයිතිය වාණිජ බැංකුවලට පැවරෙන බැවින් ගිවිසුම්වල පවතින එවැනි ඡේද සංශෝධන කිරීම පිළිබඳ රජයේ අවධානය යොමු වී නිවැරදි කර නොතිබුණි. | බදු ඉඩම් ඇපයට තබා දීර්ඝකාලීන ණය මුදල් වාණිජ බැංකුවලින් ලබාගැනීමේදී, එම ණය මුදල් පියවා දැමීමට එම සමාගම්වලට නොහැකි වුවහොත් එම ණය සම්බන්ධයෙන් රජයට වගකීමක් නොපැවරෙන බවට හා ඉඩම් බදුදීමේ අරමුණු ඉටුවියයුතු බවට කොන්දේසි ඇතුළත් කිරීමට කටයුතු කළයුතුය. | බදු ගිවිසුම මගින් වැවිලි සමාගම් වෙත පවරා ඇත්තේ අදාළ ඉඩම්වල බදු අයිතිය පමණි. ප්‍රාදේශීය වැවිලි සමාගම් විසින් වතු උකස්කර ණය ලබාගැනීමේදී බදු අයිතිය පමණක් බැංකුව වෙත පැවරෙන අතර, ඉඩම්වල අයිතිය නොපැවරේ. ඒ සඳහා බදු ගිවිසුම් මගින් වැවිලි සමාගම් වෙත ප්‍රතිපාදන ලබා දී ඇත.<br><br>බදු ගිවිසුම් සංශෝධනය කරන්නේ නම් බදු දීමනාකරු හා බදු ගැනුම්කරු අතර එකඟතාවයකින් සිදුකළ යුතු බව සඳහන්ව ඇති බැවින් බදු කොන්දේසි කඩ කිරීම මත එළඹ ඇති ගිවිසුම් අහෝසි කිරීමේ හැකියාව සම්බන්ධයෙන් නීතිපති උපදෙස් ලබා ගැනීමට කටයුතු කරන ලදි. නීතිපතිගේ 2020 ඔක්තෝබර් 22 දිනැති ලිපිය මගින් ඒ සඳහා ප්‍රතිපාදන ඇති බවට උපදෙස් ලබා දී ඇති බැවින් ඒ සම්බන්ධයෙන් සොයා බලා කටයුතු කිරීම සඳහා බදු දීමනාකරුවන ජනතා වතු සංවර්ධන මණ්ඩලයට හා ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවට දන්වා ඇත. |

| | | | |
|---|---|---|---|
| (ඊ) | 1992 වර්ෂයේදී වැවිලි සමාගම් 23 ක් වෙත ලබා දී තිබූ රජයට අයත් එකතුව අක්කර 617,486 ක් වූ වතුවලින්, අක්කරයකට අයකරන වාර්ෂික බදු කුලිය රු.456 ත්, රු.3,067 ත් අතර පරාසයක් ගෙන තිබුණි. වර්තමානයේ ඉඩම්වල වාණිජ වටිනාකම සලකා බැලීමේ දී අය කරනු ලබන මෙම බදු කුලිය සංශෝධනය කිරීම පිළිබඳව බදු දීමනාකරුගේ අවධානය යොමු වී නොතිබුණි. | වර්තමානයේ ඉඩම්වල වාණිජ වටිනාකම සලකා අය කරනු ලබන බදු කුලිය සංශෝධනය කිරීම පිළිබඳව අදාල පාර්ශවයන්ගේ අවධානය යොමු කළ යුතුය. | ප්‍රාදේශීය වැවිලි සමාගම්වල බදු දීමනාකරු ජනතා වතු සංවර්ධන මණ්ඩලය හා ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව වන අතර මේ පිළිබඳ ප්‍රතිපත්තිමය තීරණ මහා භාණ්ඩාගාරය ඇතුළුව රජයේ ඉහළ මට්ටමින් ලබා ගත යුතුවේ.<br><br>1992 වර්ෂයේදී ස්ථාපිත කර ඇති ප්‍රාදේශීය වැවිලි සමාගම් 23ට අදාළව, එම වර්ෂයේ සිට 1995 ජුනි දක්වා බදුකුලී අයකිරීම සිදුකළ යුත්තේ එම වැවිලි සමාගම් වෙත බදු දෙන ලද ඉඩම්වල හිමිකරුවන් වන ජනතා වතු සංවර්ධන මණ්ඩලය හා ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව විසිනි. (අදාළ බදු ගිවිසුම් අනුව) 1995 වර්ෂයේදී රජය ප්‍රාදේශීය වැවිලි සමාගම් සමග අත්සන් කර ඇති සංශෝධිත බදු ගිවිසුම් අනුව එම වැවිලි සමාගම්වල 1994 දෙසැම්බර් 31 දිනට තිබූ ශුද්ධ වත්කම්වල වටිනාකම රු. මිලියන 200 ඉක්මවූ සමාගම්වල පමණක් බදුකුලී සංශෝධනය වී ඇත. ඒ අනුව බදු කුලී සංශෝධනය වූ වැවිලි සමාගම් වලින් බදුකුලී අයකිරීම එම බදු ගිවිසුම් අනුව මහා භාණ්ඩාගාරය වෙනුවෙන් වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය විසින් සිදු කරනු ලැබේ. වර්තමානයේ ඉඩම්වල වාණිජ වටිනාකම වැඩි වී තිබුණද, බදු කුලී පිළිබඳව සංශෝධනයක් කළ හැකි වන්නේ බදු ගිවිසුමේ සඳහන් කොන්දේසි සංශෝධනය කිරීමකින් පසුව වන අතර බදු ගිවිසුම් වල එවැනි සංශෝධනයක් කළ හැකි වන්නේ අදාළ සමාගමේද එකඟතාවය ඇතිවය. සමස්ත වශයෙන් සියලුම වැවිලි සමාගම් සමඟ අත්සන් කර ඇති බදු ගිවිසුම්වල සඳහන් කොන්දේසිවල සිදුවිය යුතු සංශෝධනයන් පිළිබඳව මෙම අමාත්‍යාංශය විසින් මහා භාණ්ඩාගාරය දැනුවත් කර ඇත.<br><br>එසේ ලබාදෙන තීරණ අනුව වැවිලි කළමනාකරණ අධීක්ෂණ අංශය ඉදිරියේදී කටයුතු කරනු ලැබේ. |

## 2.2 වියදම් කළමනාකරණය

---------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශ | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන වැය විෂයයන් 18 ක් සඳහා සලසා තිබුණු එකතුව රු. මිලියන 21 ක ප්‍රතිපාදනවලින්, එකතුව රු. මිලියන 16 ක් පමණක් උපයෝජනය කර තිබුණි. | ඉටු කළ හැකි කාර්යභාරය ප්‍රමාණයට සරිලන පරිදි ප්‍රතිපාදන සලසා ගත යුතුය. | වැය විෂයන් 18න් 16ක් පමණම ගරු අමාත්‍ය තුමන්ගේ සහ ගරු රාජ්‍ය අමාත්‍ය තුමන්ගේ වැය විෂයන්හි ඉතිරිවීම් වේ.එම වැය විෂයන්ගේ ඉතිරිවීම් සඳහා කාර්යය මණ්ඩල පත් කිරීම් ප්‍රමාද වීම, අක්මුදල් නොලැබීම මත 2019 වර්ෂයේ දෙසැම්බර් මස බිල්පත් සඳහා 2020 වර්ෂයේදී ගෙවීම් සිදුකිරීමත් බලපාන ලදි. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන වැය විෂයයන් 18 ක් සඳහා සලසා තිබුණු එකතුව රු. මිලියන 1,014 ක ප්‍රතිපාදනවලින්, උපයෝජනය කර තිබුණේ එකතුව රු. මිලියන 468 ක් පමණි. | ප්‍රාග්ධන වැය විෂයයන් සඳහා සලසා තිබුණු ප්‍රතිපාදන උපයෝජනය සඳහා වසර ආරම්භයේ සිට ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව කටයුතු කළ යුතුය. | සැලසුම් අංශයේ සම්බන්ධීකරණයෙන් මෙහෙයුම් කටයුතු සිදු වන වැය විෂයයන් 8ක් යටතේ ක්‍රියාත්මක ව්‍යාපෘති 20කට අදාළව ප්‍රතිපාදන උපයෝජනය නොවීමට බලපානු ලැබූ ප්‍රධාන හේතුව වූයේ අවස්ථා දෙකකදී ජාතික අයවැය දෙපාර්තමේන්තුව විසින් අනුමත ප්‍රතිපාදන සංශෝධනය කරමින් (අඩු කර) සිදු වූ ක්‍රියාවලිය හා අඛණ්ඩව වර්ෂය අවසානය තෙක් අක්මුදල් ලැබීම අක්‍රමවත් වීම මත නිසි ක්‍රියාත්මක සැලැස්මට අනුව ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට නොහැකි වීමත් ය. |
| (ඇ) | සංවර්ධන උප ව්‍යාපෘති 02 ක් සඳහා පරිපූරක ඇස්තමේන්තු වෙන්කිරීම් මඟින් ලබා දී තිබූ රු.236,966,000 ක ප්‍රතිපාදනවලින් රු. 142,717,365 ක් ඉතිරි වී තිබූ බැවින් අනුමත කර තිබූ පරිපූරක ඇස්තමේන්තු තාත්වික නොවන බව නිරීක්ෂණය විය. | පරිපූරක ඇස්තමේන්තු මගින් ප්‍රතිපාදන ඉල්ලුම් කිරීමට පෙර අමාත්‍යාංශයට එම ප්‍රතිපාදන අත්‍යාවශ්‍යයද යන්න තීරණය කළ යුතු ය. | 2019 වර්ෂය අග හිමි වූ අතිරේක ප්‍රතිපාදනයක් වන අතර, ජනාධිපතිවරණය ප්‍රකාශයට පත්වීමත් සමඟ ව්‍යාපෘති කාර්යයන් අත්හිටුවීමෙන් ඉතිරියක් සිදුව ඇත.<br><br>135-2-3-39-2202 කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය යටතේ කුඩා තේ වතු හිමියන්ගේ ඵලදායිතාවය ඉහළ නැංවීමට සහාය ලබාදීම සඳහා |

| | | | |
|---|---|---|---|
| | | | ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ව්‍යාපෘති යෝජනාව සඳහා අදියර දෙකක් යටතේ ප්‍රතිපාදන වෙන් කෙරිණි. මූලිකව ලබාදුන් රු.මිලියන 150 ක ප්‍රතිපාදනය සඳහා ප්‍රථම ඇණවුම ලබාදී තිබූ අතර, මැතිවරණය ප්‍රකාශයට පත්වීමේ හේතුවෙන් මෙම ප්‍රසම්පාදනයේ ඉදිරි පියවර ක්‍රියාත්මක නොවීමද, අක්මුදල් ප්‍රමාණවත් නොවීම නිසා ලබාගත් භාණ්ඩ සඳහා සම්පූර්ණයෙන් ගෙවීම් සිදුනොවීමද ප්‍රතිපාදන ඉතිරියට හේතු විය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන වැය විෂයන් 04 ක් සඳහා පරිපූරක ඇස්තමේන්තු මගින් වෙන් කළ රු.3,727,500 ක ප්‍රතිපාදනවලින් රු.1,557,159 ක් ඉතිරි වී තිබුණු බව නිරීක්ෂණය විය. | පරිපූරක ඇස්තමේන්තු මගින් ප්‍රතිපාදන ඉල්ලුම් කිරීමට පෙර අමාත්‍යාංශයට එම ප්‍රතිපාදන අත්‍යාවශ්‍යයද යන්න තීරණය කළ යුතුය. | 135-1-0-1409 සහ 135-1-11-1201 යන වැය විෂයන් සඳහා අක්මුදල් නිසි පරිදි නොලැබීම මත 2020 වර්ෂයේදී ගෙවීම් කිරීමට සිදුවිය. අදාළ ගෙවීම් බැරකම් යටතේ සටහන් (iii) හි දක්වා ඇත.<br>135-1-11-1202 වැය විෂය සඳහා රාජ්‍ය අමාත්‍යවරු දෙදෙනෙකුට සහ කාර්යමණ්ඩලයට ගෙවීමට අපේක්ෂා කළ ප්‍රමාණයන්ගෙන් අතිරේක ප්‍රතිපාදන සලසා ගත් අතර, එම වියදම් අපේක්ෂා කළ ප්‍රමාණයෙන් සිදු නොවීම මත ඉතිරියක් ඇති වි<br><br>135-1-2-1505 වැය විෂය සඳහා ගෙවීමට සිදු වේ යයි ඇස්තමේන්තුගත ඩොලර් අගය මත අතිරේක ප්‍රතිපාදන ඉල්ලුම්කර ඇති අතර ඩොලර් අගයේ වෙනස්වීම මත ප්‍රතිපාදන ඉතිරි විය. |

**2.3 රජයේ නිලධාරින්ට අත්තිකාරම් පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

---

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2019 දෙසැම්බර් 31 දිනට නිලධාරීන් 07 දෙනෙකුගෙන් අයවිය යුතු එකතුව වූ රු.597,030 ක ණය ශේෂ, වසර 04 ත් වසර 30 ත් අතර කාලයක් තිස්සේ හිඟ හිටව පැවතෙන අතර ඒවා නිරවුල්කර නොතිබුණි. | 2004 ඔක්තෝබර් 11 දිනැති අංක 118 දරන ජාතික අයවැය චක්‍රලේඛය පරිදි කටයුතු කර නිරවුල් කළ යුතුය . | එකඟ වෙමි. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 විදේශ ආධාර ව්‍යාපෘති**

පහත සඳහන් නිරීක්ෂණයන් කුඩා තේ හා රබර් වතු පුනර්ජීවන ව්‍යාපෘතිය පිළිබඳව කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) දිස්ත්‍රික්ක 8 ක ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතු සඳහා හා ව්‍යාපෘතියේ ප්‍රධාන කාර්යාලය සඳහා උපයෝජනය කිරීමට ව්‍යාපෘතිය විසින් 2018 සැප්තැම්බර් 04 වන දින ඩබල් කැබ් රථ 10 ක් මිලදීගෙන තිබුණි. එයින් නුවරඑළිය දිස්ත්‍රික්කය සඳහා වෙන්කර තිබූ ඩබල් කැබ් රථය වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය වෙත 2019 පෙබරවාරි 21 වන දින පැවරීමේ ප්‍රතිපලයක් ලෙස, ව්‍යාපෘතිය විසින් නුවරඑළිය දිස්ත්‍රික්කය තුළ භාවිතා කිරීම සඳහා වාහනයක් කුලී පදනම මත ලබාගෙන තිබුණි. ඒ සඳහා සමාලෝචිත වර්ෂය තුළදී රු.1,126,870 ක් වාහන කුලී ගාස්තු වශයෙන් ගෙවා තිබුණි. | ව්‍යාපෘතිය යටතේ වූ වත්කම් ව්‍යාපෘතියෙහි කටයුතු සඳහා පමණක් උපයෝජනය කළ යුතුය. | එම වාහනය, ව්‍යාපෘති කටයුතු සඳහා රේඛීය අමාත්‍යාංශය වෙතින් ලබා ගැනීමට මේ වන විටත් ක්‍රියාමාර්ග ගෙන ඇත. |
| (ආ) ව්‍යාපෘතියේ සැලසුම් සම්පූර්ණ කිරීමේ වාර්තාවට අනුව, 2016, 2017, 2018 හා 2019 | ව්‍යාපෘති කාලසීමාව තුළ සැලසුම්කරන ලද | 2019 ජූනි මස කෘෂිකාර්මික සංවර්ධනය සඳහාවන අන්තර්ජාතික |

| | | | |
|---|---|---|---|
| | වර්ෂ වලදී තෝරාගත් දිස්ත්‍රික්ක 06 ක පවත්නා තේ වගාවන් ගලවා ඉවත් කිරීම මගින් හෙක්ටයාර 5,500 ක භූමි ප්‍රදේශයක් සකස් කිරීමට සැලසුම් කරන ලදී. කෙසේ වෙතත්, 2016 වර්ෂය තුළදී මෙම ඉඩමේ කිසිදු වැඩකටයුත්තක් ආරම්භකර නොතිබූ අතර 2017 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා හෙක්ටයාර 1,452 ක භූමි ප්‍රමාණයක් පමණක් සකස් කර තිබුණි. ඒ අනුව, 2019 වර්ෂයේදී නැවත වගා කිරීමේ ඉලක්කය හෙක්ටයාර 4,500 දක්වා සංශෝධනය කිරීමට ව්‍යාපෘතිය විසින් තීරණය කර තිබුණි. එමෙන්ම, සැලසුම්කළ පරිදි ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී සැලකිය යුතු ප්‍රමාදයක් නිරීක්ෂණය විය. | කටයුතු සිදුකිරීම කළයුතුය. | සංවිධානයේ මධ්‍ය කාලීන සමාලෝචනයෙහි නිර්දේශයන් මත පදනම්ව, තේ නැවත වගා කිරීමේ සම්පූර්ණ ඉලක්කය හෙක්ටයාර 4,500 දක්වා අඩු කර තිබුණි. මූලික සැලසුම් සමාලෝචනයේදී ඇති වූ සැලසුම් දෝෂයක් හේතුවෙන් ව්‍යාපෘතිය ආරම්භ කිරීමට සැලකිය යුතු ප්‍රමාදයක් ඇති වූ අතර, තාක්ෂණික සේවා සපයන්නාගෙන් (කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය) ලද දුර්වල තාක්ෂණික සහාය ආදිය . |
| (ඇ) | කුඩා තේ වතු සංවර්ධන අධිකාරියෙහි කොන්දේසියට අනුව, ඉඩම් ශුද්ධ කිරීම සඳහා පෙර ගෙවීම සිදුකර වර්ෂ දෙකක් ඇතුළත තේ නැවත වගා කිරීම සිදුකළ යුතුය. කෙසේ වෙතත්, 2017 වර්ෂයේදී කරන ලද පෙර ගෙවීම් රු. මිලියන 138 කට අදාළව හෙක්ටයාර 1,037 ක භූමි ප්‍රමාණයෙන්,2019 වර්ෂයේදී හෙක්ටයාර 610 ක් හෙවත් සියයට 58 ක් පමණක් වගා කර තිබුණි. | ව්‍යාපෘති ක්‍රියාකාරකම් අධීක්ෂණය කිරීමට කටයුතු කළ යුතුය. | පෙර ගෙවීම්වලින් විශාල කොටසක් සිදුකර ඇත්තේ 2017 වර්ෂය අගභාගයේදීය. ඒ අනුව විශාල කොටසක් ආරම්භ කර ඇත්තේ 2018 මැයි සිට ජූනි කාල පරිච්ඡේදය තුළදීය. එම නිසා 2019 වර්ෂයේදී වගා කර ගැනීමට හැකි වූයේ හෙක්ටයාර් 610 ක් පමණි. |
| (ඈ) | 2017 හා 2018 වර්ෂයන්වලදී දිස්ත්‍රික්ක 06 ක හෙක්ටයාර් 729.77 ක තේ වගාව සඳහා ප්‍රතිලාභීන් 3,331 දෙනෙකුට මූලික සහනාධාර ලෙස එකතුව රු.109,263,440 ක් ගෙවා තිබුණද, ඉඩම් මැනීමේ ප්‍රමාදය, මානා සිටුවීමේ ප්‍රමාදය, වගාකරුවන් සහනාධාර ක්‍රමයෙන් ඉවත්වීම හා තේ වගා මාර්ගෝපදේශ අනුගමනය නොකිරීම වැනි හේතූන් නිසා ඉදිරි සහනාධාර ගෙවීම් නතර වී තිබුණි. | ක්ෂේත්‍ර නිලධාරීන්ගේ කාර්යක්ෂමතාවය වැඩි දියුණු කිරීමට ක්‍රියාමාර්ග ගත යුතුය. වගා කටයුතු සිදු කිරීම සඳහා වගාකරුවන් දිරිමත් කළ යුතුය. නැතහොත් පෙර ගෙවීම් නැවත අය කිරීම සිදුකළ යුතුය. | එකඟයි. පළකර ඇත. සියලුම පෙර ගෙවීම් ලැබූවන් (නැවත ගෙවීම් සිදුකළ පුද්ගලයන් හැර) හැකි ඉක්මනින් නැවත වගා කිරීමේ ක්‍රියාවලිය තුළට ඇතුළත්කර ගැනීමට අපේක්ෂාකර ඇත. |
| (ඉ) | වාර්ෂික වැඩ සැලැස්ම හා 2019 වර්ෂය සඳහා වන අයවැයට අනුව, සේවා සැපයීමේ ක්‍රියාවලිය වැඩි දියුණු කිරීම, තම ව්‍යාපාරික කටයුතු ආරම්භ කිරීම හා හොඳම භාවිතයන් | සැලසුම් කළ ක්‍රියාකාරකම් ප්‍රමාදයකින් තොරව සැලසුම්කළ කාලසීමාව | නියමිත පරිදි, 2019 නොවැම්බර් මාසයේදී ප්‍රසම්පාදන ක්‍රියාවලිය ආරම්භකර ඇති අතර 2020 පෙබරවාරි මාසය වන විට එය |

| | | | |
|---|---|---|---|
| | යොදාගැනීමට දිරිමත් කිරීම යනාදි කරුණු සඳහා එක් තේ සමිතියකට රු.220,000 බැගින් වන මෙවලම් කට්ටල හා උපකරණ බෙදාහැරීමට අදාල ව්‍යාපෘතිය විසින් තේ සමිති 200 කින් සමිති 110 ක් තෝරාගෙන තිබුණි. සමාලෝචිත වර්ෂය සඳහා වන ප්‍රසම්පාදන සැලැස්මට අනුව, 2019 පෙබරවාරි මාසයේදී ප්‍රසම්පාදන ක්‍රියාවලිය අවසන් කළ යුතු වුවත්, එය සමාලෝචිත වර්ෂය අවසාන වන විට අවසන්කර නොතිබුණි. ඒ අනුව, තේ සමිති නඟා සිටුවීමේ භෞතික ප්‍රගතියක් අත්පත්කර ගැනීමට ව්‍යාපෘතියට නොහැකි වී තිබුණි. | තුළ ක්‍රියාත්මක කළ යුතුය. | සම්පූර්ණකර තිබුණි. 2020 මාර්තු මාසය වන විට මෙවලම් හා උපකරණ තෝරාගත් සමිති වෙත බෙදාහැරීම අවසන් කිරීමට සැලසුම්කර තිබුණද, COVID 19 වසංගත තත්වය හේතුවෙන්, සැලසුම්කළ පරිදි ප්‍රසම්පාදන ක්‍රියාවලිය අවසන් කිරීමට නොහැකි වී තිබුණි. |
| (ඊ) | ව්‍යාපෘතියේ සැලසුම් සම්පූර්ණ කිරීමේ වාර්තාවට අනුව, 2016,2017,2018 හා 2019 වර්ෂයන්හිදී තෝරාගත් දිස්ත්‍රික්ක 02 ක හෙක්ටයාර 3,000 ක භූමි ප්‍රදේශයක රබර් වගා කිරීමට සැලසුම් කරන ලදී. කෙසේ වෙතත්, නව වගාවන් සඳහා වගාකිරීමේ බලපත්‍ර හෙක්ටයාර 2,575 ක භූමි ප්‍රමාණයක් සඳහා පමණක් රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් නිකුත්කර ඇති අතර, මෙම යෝජනා ක්‍රමයෙන් වගා කරුවන් ඉවත්වී තිබීම හා වගාකරුවන් වෙනත් භෝග වගා කිරීම සඳහා යොමුවීම වැනි හේතූන් නිසා හෙක්ටයාර 2,094 ක භූමි ප්‍රමාණයක් පමණක් 2019 දෙසැම්බර් මාසය වන විට වගාකර තිබුණි. ඒ අනුව, සැලසුම්කළ පරිදි ව්‍යාපෘතිය විසින් එහි ඉලක්කය මුළුමනින්ම අත්පත්කරගෙන නොතිබුණි. | ව්‍යාපෘති කාලසීමාව තුළ සැලැසුම් කරන ලද කටයුතු සිදුකිරීම කළ යුතුය. | 2020 මහ කන්නයේදී ඉතිරි ඉලක්කය සපුරාගැනීමට අවශ්‍ය කටයුතු ව්‍යාපෘතිය විසින් දැනටමත් සැලසුම් කර ඇත. |
| (උ) | 2019 සැප්තැම්බර් 15 සිට දෙසැම්බර් 15 දක්වා කාලය තුළ, ව්‍යාපෘතිය විසින් අම්පාර හා මොනරාගල දිස්ත්‍රික්කය තුළ පිළිවෙලින් හෙක්ටයාර 1,014 ක් හා හෙක්ටයාර 780 ක භූමි ප්‍රමාණයක රබර් පැළ වගා කිරීමට සැලසුම්කර තිබුණි. 2019 සැප්තැම්බර් මස සිට රබර් පැළ 925,704 ක් අදාළ භූමි ප්‍රදේශ වෙත ප්‍රවාහනය කිරීමට කටයුතු සිදුකර තිබුණද, මාසයක ප්‍රමාදයකින් පසු රබර් පැළ 612,725 ක් පමණක් ප්‍රවාහනය කර තිබුණි. මෙහි ප්‍රතිඵලයක් ලෙස, අපේක්ෂිත ඉලක්කයෙන් සියයට 34 ක් වත් සම්පූර්ණ | මෝසම් වැසි සමය ආරම්භයත් සමඟ වගා කටයුතු සිදුකිරීම සඳහා සියලු ක්‍රියාකාරකම් සූදානම් කළ යුතුය. | මෙම දිස්ත්‍රික්කවල, වගා කටයුතු සිදුකරන සමයේ ඉහළ වර්ෂාපතනයක් ලැබීමත් සමඟ වගා කටයුතුවලට දැඩි ලෙස බලපෑම් සිදු වූ අතර, 2019 වර්ෂයේදී, සැලසුම්කළ පරිදි සම්පූර්ණ ඉලක්කය අත්පත් කරගැනීමට නොහැකි වී තිබුණි. |

| | | | |
|---|---|---|---|
| | කිරීමට ව්‍යාපෘතියට නොහැකි වී තිබුණි. | | |
| (ඌ) | ව්‍යාපෘතිය විසින් 2019 වර්ෂයේ මහ කන්නයේදී මොනරාගල දිස්ත්‍රික්කයේ හෙක්ටයාර 572.4 ක භූමි ප්‍රදේශයක රබර් වගාකිරීමට සැලසුම් කර තිබූ අතර වගාකරුවන්ට කොම්පෝස්ට් පොහොර කිලෝ ග්‍රෑම් 886,075 ක සැපයීමට සැලසුම් කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ. | | |
| (i) | පැළ බෙදා හැරීම 2019 ඔක්තෝබර් 12 වන දින ආරම්භ කර 2019 දෙසැම්බර් 15 වන දින අවසන්කර තිබුණද, පැළ බෙදාහැරීමේ කාල සීමාව තුළ කිසිදු ආකාරයකින් පොහොර බෙදා හැරීම සිදුකර නොතිබුණි. ඒ අනුව, පැළ සිටුවීමේදී පස් සමඟ පොහොර මිශ්‍ර කිරීම කළ නොහැකි වී තිබුණි. | නියමිත කාල සීමාව තුළ සියලු ව්‍යාපෘති කටයුතු ක්‍රියාත්මක කළ යුතුය. | 2019 වර්ෂයේ මහ කන්නයේදී ඇති වූ දැඩි වර්ෂාව හේතුවෙන් වගාබිම් වලට පොහොර බෙදාහැරීම කෙරෙහි දැඩි බලපෑම් ඇති වී තිබුණි. |
| (ii) | හෙක්ටයාර 572.4 ක භූමි ප්‍රමාණයක් සඳහා කොම්පෝස්ට් පොහොර අවශ්‍යතාවය කිලෝ ග්‍රෑම් 886,075 ක් විය. කෙසේ වෙතත්, කොම්පෝස්ට් පොහොර කිලෝ ග්‍රෑම් 747,475 ක් පමණක් වගාකරුවන්ට සපයා තිබුණි. ඒ අනුව පැළ 46,200 ක් හෝ හෙක්ටයාර 89.5 ක භූමි ප්‍රදේශයක් සඳහා ඉතිරි කිලෝ ග්‍රෑම් 138,600 ක පොහොර සැපයීමට නොහැකි වී ඇති බව නිරීක්ෂණය විය. | නියමිත කාල සීමාව තුළ වගා කරුවන්ට පොහොර ලබා දීම සිදුකළ යුතුය. | වැසි සමය අවසන් වීමත් සමඟ, කොම්පෝස්ට් පොහොර සැපයීම සඳහා නැවත දිනයක් නියමකර වගාකරුවන්ට සැපයීම සිදු කරන ලදී. |
| (එ) | ව්‍යාපෘතියෙහි සැලසුම් සම්පූර්ණ කිරීමේ වාර්තාවට අනුව, තේ දළු නෙලීමේ හා රබර් කිරි කැපීමේ කාල සීමා දක්වා අභිමිවන ආදායම ආවරණය කර ගැනීමට වගාකරුවන්ට වාණිජ බැංකු හරහා ස්වයං රැකියාවල යෙදීම සඳහා හෝ කෙටි කාලීන ආදායම් උපයන | සැලසුම් කරන ලද කටයුතු, ප්‍රමාදයකින් තොරව සැලසුම්කරන ලද කාලසීමාව තුළ ක්‍රියාත්මක කළ යුතුය. | ව්‍යාපෘතියේ මූලික සංරචකයක් වන මෙම වැඩසටහන ආරම්භ කිරීමේ ප්‍රමාදයන් පැවතුණි. |

| | | | |
|---|---|---|---|
| | මාර්ග ඇතිකර ගැනීමට, ණය පහසුකම් ලබා දීම වෙනුවෙන් රු. මිලියන 422.6 ක් වෙන්කර තිබුණි. කෙසේ වෙතත්, 2016 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා, කාලය තුළ ණය පහසුකම් ලබාදීම ක්‍රියාත්මක කර නොතිබුණි. 2019 වර්ෂයේ වාර්ෂික වැඩ සැලැස්ම හා අයවැය ලේඛනය අනුව වගාකරුවන්ට රු. මිලියන 20 ක ණය පහසුකම් ලබාදීමට ව්‍යාපෘතිය විසින් සැලසුම්කර තිබුණද එය 2019 දෙසැම්බර් 31 දක්වා ක්‍රියාත්මක කර නොතිබුණි. | | |
| (ඒ) | වර්ෂයකට රබර් පැළ 250,000 ක් බැගින් සැපයීමේ ධාරිතාවයකින් යුතු, රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවට අයත් අම්පාර දිස්ත්‍රික්කයෙහි පදියතලාවේ පිහිටි පැළ තවාන වැඩි දියුණු කිරීමට ව්‍යාපෘතිය විසින් 2018 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා කාලය තුළ රු. මිලියන 42 ක් වැය කර තිබුණි. මේ මගින් වගාවන්ට අදාළ වැවක්, වාරිමාර්ග පද්ධතියක්, ආදර්ශ ගෙවත්තක්, අංකුර පැළ තවානක්, අංකුර කැපීමේ තවානක් හා මාර්ග පද්ධතියක් 2018 දෙසැම්බර් මස වන විට, ඉදි කර අවසන් කිරීමට නියමිතව පැවතියද, එය වර්ෂයකට වඩා ප්‍රමාද වී පැවතිණි. ඒ අනුව, සමාලෝචිත වර්ෂය තුළ අපේක්ෂිත පැළ ධාරිතාවය කරා ලඟා වීමට නොහැකි වී තිබුණි. | අවශ්‍ය රබර් පැළ නිෂ්පාදනය සපුරා ගැනීම සඳහා ඉදිකිරීම් වැඩ කඩිනම් කළ යුතුය. | මෙහි සියලුම ප්‍රසම්පාදන කටයුතු රබර් සංවර්ධන දෙපාර්තමේන්තු විසින් සිදුකර තිබූ අතර එම ආයතනය ඉදිරිපත් කර තිබූ තොරතුරු අනුව මේ වන විට වැවෙහි ඉදිකිරීම් පමණක් ඉතිරි වී තිබූ අතර එහි නිමවුම් ප්‍රගතිය සියයට 70 ක් විය. |
| (ඔ) | 2019 දෙසැම්බර් මාසයේදී රබර් පැළ මිලදී ගැනීමට හා ප්‍රවාහනයට රු.2,015,806 ක් ව්‍යාපෘතියෙහි ගිණුම් පොත් වල සටහන් කිරීමෙන් තොරව ගෙවීම් කර තිබීම නිසා 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල ඉතිරි මුදල් ශේෂය එම වටිනාකමෙන් වැඩියෙන් දක්වා තිබූ අතර සමාලෝචිත වර්ෂය සඳහා මුළු වියදම අඩුවෙන් දක්වා තිබුණි. | සමාලෝචිත වර්ෂය තුළ දරන ලද සියලුම වියදම් ගිණුම්ගත කළ යුතුය. | වර්ෂය අවසානයේ වැඩ කටයුතු අධික වීම හේතුවෙන් ඇති වූ ලිපිකාර දෝෂය නිසා මෙම කරුණ ඉස්මතු වී ඇත. මෙම දෝෂය දැනටමත් නිවැරදි කර ඇත. |

## 3.3 කළමනාකරණ දූර්වලතා

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) රජයේ ඉඩම් අනවසරයෙන් අත් කර ගැනීම | | |
| බදු කුලී ගිවිසුම් මඟින් වැව්ලි සමාගම් වෙත පවරා දුන් ඉඩම්, බදු ගැනුම්කරු විසින් සුරක්ෂා කරන බවට පොරොන්දු වී තිබූ නමුත්, ප්‍රාදේශීය වැව්ලි සමාගම් 16 ක් වෙත බදු පදනම මත රජය විසින් ලබා දී තිබූ ඉඩම්වලින් අක්කර 795.96 ක් හා එම වතුවලට අයත් නිල නිවාස 172 ක් අනවසර පුද්ගලයන් විසින් බුක්ති විඳින බව වාර්තා වී තිබුණි. එසේ අනවසර පදිංචිවීම් වාර්ෂිකව වර්ධනයවීම නිසා එම ඉඩම්වල සුරක්ෂිතභාවය හා ඒවා අපේක්ෂිත අරමුණු කරා යොදා ගැනීම පිළිබඳව බදු දීමනාකරුගේ සහ වැව්ලි කළමනාකරණ අධීක්ෂණ අංශයේ අවධානය යොමු වීම ප්‍රමාණවත් නොවන බව නිරීක්ෂණය විය. | 1979 අංක 7 දරන රජයේ ඉඩම් (සන්තකය ආපසු ලබා ගැනීමේ) පනත අනුව කටයුතු කළ යුතුය. | අනවසර පදිංචිකරුවන් වෙත ප්‍රථමයෙන්ම දෙසති දැන්වීම් මගින් අදාළ ඉඩමෙන් ඉවත්වන ලෙස දැනුම් දෙන අතර, දෙවනුව එසේ ඉවත් නොවුනහොත් අස්කිරීමේ දැන්වීම් නිකුත් කරනු ලැබේ. අස්කිරීම් දැන්වීම මගින්ද ඉවත් නොවුනහොත් නඩු පැවරීමට කටයුතු කරනු ලැබේ. කෙසේ වුවද, අනවසර පදිංචිකරුවන් ඉවත් කිරීමට කටයුතු කිරීමේදී වැවිලි කළමණාකරන අධීක්ෂණ අංශයට විවිධ බලපෑම් පවතින අතර මෙවැනි බලපෑම් හේතුවෙන් අනවසර පදිංචිකරුවන් ඉවත් කිරීමේ කටයුතු ප්‍රමාද වී ඇත. සමහරක් දිස්ත්‍රික්කවල දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු මගින් තීරණයන් ලබාගෙන තිබීම ද ප්‍රමාදයට හේතු වී ඇත. |
| (ආ) වාහන උපයෝජනය | | |
| (i) අධික ඉන්ධන පරිභෝජනය නිසා එකතුව රු. 14,500,000 ක පිරිවැය වූ මෝටර් රථ දෙකක් 2019 දෙසැම්බර් මස සිට ධාවනය නොකර පැවති අතර, වාහන මිලදී ගැනීමේදී නඩත්තු පිරිවැය පිළිබඳව සැලකිලිමත්වී නොමැති බව මේ අනුව නිරීක්ෂණය විය. | වාහන මිලදී ගැනීමේදී නඩත්තු පිරිවැය පිළිබඳව සැලකිලිමත් විය යුතු අතර දැනට පවතින එවැනි වාහන සම්බන්ධයෙන් මහා භාණ්ඩාගාරයෙන් උපදෙස් ලබා ගෙන කටයුතු කළ යුතුය. | එක් රථයක් 2013 චොගම් සමුළුව වෙනුවෙන් රැගෙන එන ලද වාහනයක් වන අතර එම වාහන සමුළුවෙන් අනතුරුව අමාත්‍යවරුන්ගේ නිල වාහන ලෙස අනුයුක්ත කිරීමට ලබා දී ඇත.<br>රාජකාරි පහසුව පිණිස ජීප් රථ භාවිත කිරීම හේතුවෙන් අඩු ඉන්ධන කාර්යක්ෂමතාවය හා නඩත්තු කිරීමේ අපහසුතා ඇති |

මෝටර් කාර් රථ උක්ත කාර්යයන්ගෙන් ඉවත් කිරීමට සිදු විය. තව ද, මෙම රථ සුඛෝපභෝගී වන බැවින් සංචිත රාජකාරි කටයුතු සඳහා යොදවා ගැනීම ද අපහසු වේ. එනමුත් නිල වාහන හදිසි අලුත්වැඩියා හා නඩත්තු කටයුතු සඳහා යොමුකරන අවස්ථාවන්වලදි ගරු අමාත්‍යවරුන් ඇතුළුව වාහන හිමි නිලධාරින් වෙත මෙම රථය තාවකාලිකව ලබාදෙන අතර මේ වන විට ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ සභාපතිගේ නිල රථය ලෙස තාවකාලිකව ලබාදෙන ලෙස සිදුකළ ඉල්ලීම පරිදි එම කටයුතු සඳහා ලබාදී ඇත.

අනෙක් මෝටර් රථය 2010 වසර නිෂ්පාදිත රථයක් වන අතර මෙම රථය පැවති පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන ගරු අමාත්‍යවරයා භාවිත කළ රථයක් වේ. ගරු අමාත්‍යතුමන් වෙත අලුතින් ජීප් රථ ලබාගත් පසු සෙසු කාර්යයන් සඳහා මෙම රථය භාවිතා කිරීමට සිදුව ඇත.

ඉන්ධන කාර්යක්ෂමතාවය අවම වීම හේතුවෙන් සංචිත කාර්යයන් සඳහා යොදවා ගැනීම අපහසු වන මෙම රථය, විටින් විට මාණ්ඩලික නිලධාරින් සඳහා අනුයුක්ත කිරීමට කටයුතු කළ ද කොළඹ හා තදාසන්න නගර සීමාවන් තුළ ධාවනය කිරීමේදි අධික ඉන්ධන දහනයක් සිදුවන බැවින් එම නිලධාරින් මෙම රථය ද දිගු කාලීනව ලබා ගැනීමට මැලිකමක් දක්වයි.

මේ වනවිට අතිරේක ලේකම් (සංවර්ධන) නිල රථය අලුත්වැඩියා සදහා යොමුකර ඇති බැවින් තාවකාලිකව අනුයුක්ත කර ඇත.

වැවිලි අමාත්‍යාංශය හා රාජ්‍ය අමාත්‍යාංශ 03ක් මෙම අමාත්‍යාංශය

| | | | |
|---|---|---|---|
| | | | සතු සම්පත් භාවිතා කරනු ලබන අතර ඒ අනුව ගරු අමාත්‍යවරු 04දෙනෙකු ලේකම්වරු 04දෙනෙකු හා අනෙකුත් මාණ්ඩලික නිලධාරින් ද ඇතුළුව නිල වාහන හිමි නිලධාරින් සඳහා වාහන ලබාදීමේදී මෙම වාහන ඵලදායි ලෙස භාවිතා කිරීමට හැකි වන බව කාරුණිකව දන්වමි. |
| (ii) | 2007 වර්ෂයේ නිෂ්පාදිත පර්ජෝ වර්ගයේ මෝටර් රථයක විද්‍යුත් පරිපත හා සෙන්සර් දෝෂයන් නිසා එහි එංජිම පණගැන්වීමට නොහැකිවීම හේතුවෙන් එය 2019 ජනවාරි 28 දිනෙන් පසුව ධාවනය කර නොතිබූ අතර, අලුත්වැඩියා සිදු කර ධාවනයට යොදා ගැනීම පිළිබඳවද අවධානය යොමු වී නොතිබුණි. | අලුත්වැඩියා සිදු කර ධාවනයට යොදා ගැනීම පිළිබඳව අවධානය යොමු විය යුතුය. | මෙම මෝටර් රථය ක්ෂේත්‍ර රාජකාරි සඳහා යොදවා ගැනීමට අපහසු බැවින් හා නිල වාහනයක් ලෙස ලබා දීමේදී ද නිලධාරින් විසින් ප්‍රතික්ෂේප කර ඇත. එබැවින් අපහරණය සඳහා යෝජනා කර තිබූ නමුත්, ජාතික වැව්ලි කළමනාකරණ ආයතනය විසින් මෙම රථය සුළු ධාවන අලුත්වැඩියාවන් සිදු කර ධාවනය සඳහා යොදා ගැනීමට කර ඇති ඉල්ලීම සලකා බලා, ඒ අනුව එම රථය ජාතික වැව්ලි කළමනාකරණ ආයතනය වෙත පවරා දීමට කටයුතු කර ඇත. |
| (ඇ) | වැලිගම පොල්කොළ මැලවීමේ හා කුණු වීමේ රෝග මර්දන වැඩ සටහන වසර 11 ක කාලයක සිට ගාල්ල, මාතර හා හම්බන්තොට යන දිස්ත්‍රික්ක 03 වෙනුවෙන් ක්‍රියාත්මක කර තිබූ අතර ,ඒ වෙනුවෙන් පොල් සංවර්ධන අධිකාරිය , පොල් පර්යේෂණ මණ්ඩලය හා මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වැයකළ මුලු මුදල රු.මිලියන 556.43 ක් විය. තවද රෝගය වැළදීම නිසා ඉවත් කළ ගස් ගණන 315,974 ක් වී තිබුණි. ඉවත්කළ ගස් ගණන 2015 වසරේ සිට ක්‍රමිකව අඩුවී තිබුණද සමාලෝචිත වසරේ සිට නැවත එය වැඩිවී තිබූ බැවින් රෝග පාලනය සාර්ථක මට්ටමක නොපවතින බව නිරීක්ෂණය විය. | වැලිගම පොල්කොළ මැලවීමේ හා කුණු වීමේ රෝගය සමාලෝචිත වසරේ සිට නැවත වැඩිවන බැවින් ඊට බලපෑ හේතු සොයා විසඳුම් යෙදිය යුතුය. | රෝගී ගස් ලෙස හඳුනාගන්නා ලද ගස් ප්‍රමාණය වර්ෂ 2015 සිට ක්‍රමයෙන් පහළ ගියද, 2018 සිට නැවත ක්‍රමයෙන් ඉහළ යනු ලැබීය. ක්ෂේත්‍ර රෝග මර්දන කාර්යයයේ යෙදෙන පොල් පර්යේෂණ ආයතනයේ හා පොල් වගා කිරීමේ මණ්ඩලයේ නිලධාරින් සමඟ පසුගිය කාලසීමාවේ මේ සම්බන්ධව දිර්ඝව සාකච්ඡා කළ අතර, එහිදි පහත කරුණු හේතු වූ බවට අවධාරණය විය.<br>i. ඉඩම් හිමියන් විසින් ඉවත් නොකරන රෝගී ගස් පොල් වගා කිරීමේ මණ්ඩලය හා පොල් පර්යේෂණ ආයතනය මඟින් එන්නත් කර විනාශ කරනු ලැබූ අතර, ගස් එන්නත් |

| | | | |
|---|---|---|---|
| | | | කළ විට වන්දි නොලැබෙන හෙයින් රෝගී ගස් කපා ඉවත් නොකිරිමට ඉඩම් හිමියන් පෙලඹී සිටියහ. නමුත් ගස් එන්නත් කිරිම සඳහා භාවිතා කරනු ලැබූ ග්ලිපොසයිඩ් වල්නාශකය තහනම් කිරිමත් සමඟම ඉඩම් හිමියන් උනන්දු කිරීමෙන් පමණක්ම ගස් ඉවත් කිරීම සිදු විය. ඉඩම් හිමියන් ගස් ඉවත් කරන මන්දගාමී ස්වභාවය අනුව නිරෝගි ගස් වෙත රෝගය පැතිරීම ඉහළ ගොස් ඇත.<br>ii. 2018 වර්ෂයේ සිට මේ දක්වා ම ඉවත් කළ ගස් සඳහා වන්දි ගෙවීමට භාණ්ඩාගාරයෙන් අක් මුදල් ලැබිම අක්‍රමවත් විය. යම් ඉඩම් හිමියෙකුට වන්දි ගෙවීම ප්‍රමාද වන විට අනෙක් ඉඩම් හිමියන්ද රෝගි ගස් ඉවත් කිරීම ප්‍රමාද කරනු ලබයි. එයද නිරෝගි ගස් සඳහා රෝගය ව්‍යාප්ත වී රෝගී ගස් ප්‍රමාණය ඉහළ යාමට හේතු විය.<br>iii. මෙම රෝගයේ ස්වභාවය අනුව රෝගය පවතින ගසක බීජ ඖෂණ කාලය මාස 8-24 අතර වේ. රෝගය බාහිරව පෙන්නුම් නොකර එකවර මෙම කාලසීමාවේදි වැඩි ගස් ප්රමාණයකට රෝගය බාහිරව පෙන්වීමද සිදුව ඇත. |
| (ඇ) | අමාත්‍යාංශයේ ව්‍යාපෘතියක් වූ කප්රුක අරමුදල සඳහා එම අරමුදල පිහිට වූ 2005 අංක 31 දරන "කප්රුක් අරමුදල පනත" 21 ඡේදය පරිදි 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කොට විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | පනත අනුව නියමිත පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය. | මෙම අමාත්‍යාංශය යටතේ වූ කප්රුක අරමුදලෙහි මූල්‍ය ප්‍රකාශන ඉදිරි වර්ෂයේදී පිළියෙල කර විගණනය සඳහා ඉදිරිපත් කරන ලෙස අදාළ නිලධාරීන් සඳහා උපදෙස් ලබා දෙන ලදී. |

**4.** **තිරසර සංවර්ධන අරමුණු ළගා කර ගැනීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| එක්සත් ජාතීන්ගේ සංවිධානයේ තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය අනුව **2015-2030** කාලය තුළ ළඟා කර ගත යුතු තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක හඳුනා ගෙන ඒවා ක්‍රියාත්මක කිරීමට **2017** අංක **19** දරන තිරසර සංවර්ධන පනත අනුව එක් එක් රාජ්‍ය ආයතන බැඳී පවතී. ඒ අනුව අමාත්‍යාංශයට අදාළ අනුබද්ධ ආයතනවල විෂයපථය අනුව අදාළ ඉලක්ක හඳුනාගෙන සැලසුම්වලට ඇතුළත් කර ඇතත් අමාත්‍යාංශයේ වැඩසටහන් සඳහා හඳුනාගත් අරමුණු , ඉලක්ක හා දර්ශක ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර නොතිබුණි. | අමාත්‍යාංශයේ වැඩසටහන් සඳහා හඳුනාගත් අරමුණු , ඉලක්ක හා දර්ශක ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කළ යුතුය. | තිරසර සංවර්ධන සභාවේ මඟපෙන්වීම් අනුව අරමුණු ඉලක්ක හා දර්ශක හඳුනාගෙන ඇත. |

**5.** **මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2019 **දෙසැම්බර්** 31 දිනට අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ මට්ටමට අයත් සහකාර අධ්‍යක්ෂ**,** සහකාර ලේකම්**,** ගණකාධිකාරීන් දෙදෙනෙකුගේ හා අභ්‍යන්තර විගණක යන තනතුරු පුරප්පාඩුව පැවතුණි. | ජ්‍යෙෂ්ඨ මට්ටමට අයත් තනතුරුවල පුරප්පාඩු පැවතීම අමාත්‍යාංශයේ කාර්යසාධනයට බලපාන බැවින් එම පුරප්පාඩු සම්පූර්ණ කිරීමට අවශ්‍ය කටයුතු කළ යුතුය. | අමාත්‍යාංශ මට්ටමින් මෙම තනතුරු සඳහා බඳවා ගැනීමේ හැකියාවක් නොමැත. රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය වෙත අවස්ථා කිහිපයකදී ලිපි යොමු කර ඇත.<br><br>2020 වර්ෂයේ දී ඉහත පුරප්පාඩු සියල්ල පිරවූ අතර මේ වනවිට අමාත්‍යාංශයේ තනතුරු ප්‍රමාණය වෙනස්ව ඇත. |